# ප්‍රදීපාගාරය යට විශ්‍රාන්තිය

ජී.පී.එල්.ලක්ෂිත

1985 වසරේ රාජ්‍ය සම්මාන දිනූ කෙටිකථා ග්‍රන්ථයක් වන "ප්‍රදීපාගාරය යට" කෙටිකථා ග්‍රන්ථය කැලණිය විශ්වවිද්‍යාලයේ ප්‍රථම වසර පරීක්ෂණ සඳහාද, කොළඹ විශ්ව විද්‍යාලයේද (සිංහල) නිර්දිෂ්ට ග්‍රන්ථයකි. මෙම කෙටිකථා ග්‍රන්ථයේ කෙටිකථා හයක් දැකගත හැකි අතර ඒ අතර එන විශ්‍රාන්තිමය අවස්ථාවන් හඳුනාගත හැකිය.

"ගේට්ටුව අසල මුහුදු තීරයට යාබද පිහිටි බිම වසා ඇති තණතිල්ලේ වැතිර මද වේලාවක් ගත කිරීමට මට සිත් වූයේ සමන්තිකා හැරදමා එක වර පලායාම නොමනවැයි සිතූනු බැවිනි............නැවතත් හීන් සාගර දිය බිඳු සුළඟ හා මුසු වී අවුත් අපගේ සිරුරුවල තැවරෙන්නට ............ සමණලුන් මෙන් වත්තේ දුව පැන ඇවිදිමින් ප්‍රීතිවන කුඩා දැරියන් දෙදෙනාට රිසිසේ සතුටු වීමට ඉඩ දී අපබලා සිටියෙමු............ වරක් ඔවුන් පෙනෙන්ට නොවූ බැවින් ඔවුන් කොහේදැයි විපරම් කරන විට සමන්තිකාගේ අතින් අල්ලාගෙන මගේ දියණියද ප්‍රදීපාගාරය අසලින් වෙරළට බැස රළ පාගනු දුටුවෙමු............ප්‍රදීපාගාරය නැරඹීමෙන් ලද ආශ්වාදයෙන් ඔකඳව සිටි මගේ දියණිය තොරතෝංචියක් නොමැතිව කථා කරන්නට වූවාය............මෙවර තාප්පය මත ඉතා තැන්පත්ලෙස වාඩි වී මුහුද දෙස බලා සිටි කුඩා දැරියක් මගේ නෙත්වලට හසුවිය............ඉතා අලංකාර ලෙසත් පිරිසිදුවත් නඩත්තු කරන බව පෙනීගිය ප්‍රදීපාගාරය පිහිටි වත්ත රමණීය බිම් කඩක් විය............සියලු වල් පැල උදුරා තිබිණු බැවින් පලසක් ඇතිරූ කලක මෙන් තණ බිස්ස නිල්වන්ව දිලිසේ............සුදු පැහැති පියළි කල ගල් විශේෂයක් අතුරා දෙපස ගඩොල් පෙලක් අල්ලා ඇති ඒ හරහා ඇති මාවත දිගේ අපි ගිරි මුදුනටම ගමන් කළෙමු............ප්‍රදීපාගාරය අසළ සිට බලන විට තුන් පැත්තකින්ම අනන්ත වූ සාගරයන් හා අනන්තවූ ඉන් නැගී එසවී එන මහා ජල කඳන් පෙනේ...........ඔහුම රථයේ යතුර කරකවා ලයිටරය රත් වූ පසු එළියට ඇද මගේ සිගරට්ටුව පළමුව දල්වා ඉන් පසුව ඔහුගේ සිගරට්ටුව දල්වා ගත්තේය............ ඉන් පසුව කට කෙලවරකින් ලොකු දුම් ගුලියක් පිට කළ ඔහු කිසිත් කථා නොකොට මඳ වේලාවක් ඉදිරිය බලාගෙන නිසොල්මනේ සිටයේය............රෝහලේ කොට බිත්ති අතරින් ඈත අහසේ ළහිරු නැගීඑන ඡායාව දුටු මොහොතේ ඔහුගේ සිත සතුටින් ඉපිළ ගියේය............කොරිඩෝව දිගේ ගමන් කරද්දී වැදුණු සීතළ සුළඟ ඊතල පහරක් සේ ඇඟ විනිවිද යනු ඔහුට දැණින............ශාලාවේ මෙහා කෙලවර පලසක් එළා ඒ මත තැබූ විට විසිත්ත කාමර පුටු කට්ටල මත බෑවී සිටි දොස්තරගේ බිරිඳ හා දියණිය ඔවුන් නරඹමින් සිටි රූපවාහිණී වැඩසටහනේ අවධානය බිඳ ඔවුන් දෙසට යන්තම් හිස හරවා බැලූ සැණින්............ඉන් පසුව පැය ගණනාවක්ම ඈ ගෙවන්නේ දොස්තර පුතා කුඩා කාලයේ කළ දඟ වැඩ කී සුරතල් කථා ආදිය ගැන මහත් අභිරුචියකින් මතක් කරමිනි............එහෙත් මිනිසුන්ගේ විවිධ ව්‍යාධි සොයා ඊට ප්‍රතිකාර කරන විවිධ ආබාධ සුව කිරීම සඳහා මිනිස් මස කපා ශල්‍ය කර්ම කරන වෛද්‍ය වෘත්තිකයන්ට ස්වාමි වරුන්ට හා නිලධාරීන්ට වඩා මිනිස් ආධ්‍යාත්මයේ සුවද වඩා සමීපව දැනෙනවා............හවස ගෙදර පැමිණි විට බර කල්පනාවක ගැලී සිටින්නේ මන්දැයි බිරිඳ ඇසූ නමුත් ඔහු ඇයට ඒ ගැන කිසිවක් නොකීවේය...........නින්ද නොයන එම රාත්‍රී කාලයේ එළිමහනේ මදක් ඇවිද්ද යුතුයැයි සිතූ ඔහු මදක් එහා මෙහා ඇවිද ඉන් පසුව පඩියේ වාඩි වී මලානික සඳ එළියෙන් වැසී ඇති නිසංසල රාත්‍රියෙහි අසිරි දෙස හුදකලාව මද වේලාවක් බලා සිටියේය............ඇඳෙහි ඇලවී හිස පිටි පස දෑත් බැඳගෙන ඔහු අඳුරු කාමරයේ දෑස් දල්වොගෙන මද වේලාවක් බලාසිටියේය............මලානික සඳරැස් කවුලුවෝ හුළං කපොලු අතරන් කාමරයට බේරී එන හැටි ඔහු දුටුවේය............"

ප්‍රදීපාගාරය යට කෙටිකතා සංග්‍රහයෙන් විශ්‍රානතායේ සදාතනික පොදු ලක්ෂණයන් මෙන් ම නූතන සමාජයේ විශ්‍රානති අවස්ථාවක් ද එකවර පිළිබිඹු කිරීම එහි ඇති විශේෂත්වයක් ලෙස දක්වමි.

රංජිත් ධර්මකීර්ති, ප්‍රදීපාගරය යට, 1984 පළමු මුද්‍රණය, එස්.ගොඩගේ සහ සහෝදරයෝ, 661 මරදානපාර කොළඹ 10.